# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120
ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1246 / 2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023 திகதி
දිනය / Date: 04/10/2023 පැය 0545

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - හඟුරන්කෙත පොලිස් වසම.

2023.10.03 වන දින දහවල් කාලයේ හඟුරන්කෙත පොලිස් වසමේ මැදකුඹුර ප්‍රදේශයේදී පොල්ලකින් හිසට පහරදීම හේතුවෙන් තුවාල ලැබූ පුද්ගලයෙකු ප්‍රථිකාර සඳහා රිකිල්ලගස්කඩ රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රථිකාර සඳහා මහනුවර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට හඟුරන්කෙත පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක් වූ මැදකුඹුර, ඉල්ලගොල්ල ලිපිනයේ පදිංචිකරුවෙකි.**

සැකකරු මරණකරුගේ බිරිදගේ සහෝදරයෙකු වන අතර ඔහු මානසික රෝගී තත්ත්වයෙන් පෙලෙන පුද්ගලයෙකු බවත් ආහාර ලබා නොදීම සම්බන්ධයෙන් ඇතිවූ ගැටළුවක් හේතුවෙන් කෝපයට පත්ව මෙම පහරදීම සිදුකර ඇති බවත් විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර හඟුරන්කෙත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. සැකකටයුතු මරණයක් - අවිස්සාවේල්ල පොලිස් වසම.

2023.10.03 වන දින රාත්‍රි කාලයේ අවිස්සාවේල්ල පොලිස් වසමේ තල්දූව අම්තිරිගල මාර්ගයේ 01 කණුව ආසන්නයේ මාර්ගයේ ලේ ගලමින් තුවාල සහිතව පුද්ගලයෙකු වැටී සිට අවිස්සාවේල්ල රෝහල වෙත ඇතුලත් කරන අවස්ථාවේ මියගොස් සිටින බවට අවිස්සාවේල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 52 ක්වූ තල්දූව, අවිස්සාවේල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුගේ හිස පිටුපස තුවාලයක් ඇති බවට නිරීක්ෂණය වී ඇති අතර, අවිස්සාවේල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. බරපතල තුවාල සහිතව සිටි පුද්ගලයෙකු රෝහල් ගත කිරීමක - පමුණුගම පොලිස් වසම.

2023.10.03 වන දින සවස් කාලයේ පමුණුගම පොලිස් වසමේ ඇලෙන්එගොඩ සුසාන භූමිය අසල ලේ ගලන තුවාල සහිතව පුද්ගලයෙකු වැටී සිටින බවට පමුණුගම පොලිස් ස්ථානයට ලද දුරකථන පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. තුවාලකරු 1990 ගිලන් රථ සේවාව මගින් රාගම රෝහල වෙත ඇතුලත් කර ඇති අතර, දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටී.

**තුවාලකරු වයස අවුරුදු 48 ක්වූ කැපුම්ගොඩ, පමුණුගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවලකරුගේ ගෙල ප්‍රදේශයේ කැපුම් තුවාලයක් සිදුව ඇති බවට නිරීක්ෂණය වී ඇති අතර, පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. ගංජා හේනක් වටලා සැකකරුවෙකු අත්අඩංගුවට - ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානය.

2023.10.03 වන දින උදෑසන කාලයේ ලුණුගම්වෙහෙර පොලිස් වසමේ රණවර්ණාව ප්‍රදේශයේදී ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **පර්චස් 20 ක පමණ භූමි ප්‍රමාණයක වගා කර තිබූ ගංජා හේනක් වටලා අඩි 05 ක් පමණ උසට වැඩී තිබූ ගංජා ගස් 40 ක් හා වියළි ගංජා කිලෝ 01 ග්‍රෑම් 950 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක්වූ රණවර්ණාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ලුණුගම්වෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 05. ගජමුතුවක් අළෙවි කිරීමට තැත්කල සැකකරුවෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස් ස්ථානය.

2023.10.03 වන දින සවස් කාලයේ දිවුලපිටිය පොලිස් වසමේ උල්ලලපොල ප්‍රදේශයේදී ගංමුතුවක් අලෙවි කිරීමට සූදානම් වන බවට දිවුලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 860 ක් බරැති ගජමුතුවක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක්වූ මොණරාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාද්දුව පොලිස් ස්ථානය.

2023.10.03 වන දින සවස් කාලයේ වාද්දුව පොලිස් වසමේ සුදුවැලි මංකඩ ප්‍රදේශයේදී වාද්දුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක්වූ මීරිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාද්දුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 07. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර උතුර පොලිස් ස්ථානය.

2023.10.03 වන දින රාත්‍රී කාලයේ කළුතර උතුර පොලිස් වසමේ කොබොදුව ප්‍රදේශයේදී කළුතර උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 50 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වූ කුඩා වස්කඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කළුතර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 08. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.

2023.10.03 වන දින රාත්‍රී කාලයේ බියගම පොලිස් වසමේ කොට්ටුන්න ඔය ප්‍රදේශයේදී බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1012 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 60 ක් වූ බියගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 09. දියේ ගිලී අතුරුදහන්වීමක් - කල්පිටිය පොලිස් වසම.

2023.10.03 වන දින දහවල් කාලයේ කල්පිටිය පොලිස් වසමේ කල්පිටිය ධීවර ජැටියෙන් මුහුදු ගිය ධීවර යාත්‍රාවක සිටි ධීවරයෙකු කලපුවට වැටී දියේ ගිලී අතුරුදහන්ව ඇති බවට කල්පිටිය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**අතුරුදහන්වූ අය වයස අවුරුදු 51 ක්වූ තලවිල පල්ලිය අසල, තලවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුදහන්වූ අය සෙවීමේ කටයුතු පොලිසිය, නාවික හමුදාව සහ ධීවරයන් එක්ව සිදුකරගෙන යනු ලබයි. කල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. නාඳුනන මළ සිරුරක් - කළුතර දකුණ පොලිස් වසම.

2023.10.03 වන දින දහවල් කාලයේ කළුතර දකුණ පොලිස් වසමේ කළුතර නගරය ආසන්නයේ වෙරළ තීරයේ නාඳුනන පිරිමි මළ සිරුරක් ඇති බවට කළුතර දකුණ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ත් 45 ත් අතර වයසේ පසුවන පුද්ගලයෙකු වන අතර, රතු ඉරි සහිත අත් කොට ටී ෂර්ට් එකක් සහ අලු පැහැති කොට කලිසමක් හැඳ සිටී.**

මෘත ශරීරය සම්බන්ධ හදිසි මරණ පරීක්ෂණය සිදුකර කළුතර නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කළුතර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 11. දුම්රිය අනතුරක් - එරාවූර් පොලිස් වසම.

2023.10.03 වන දින දහවල් කාලයේ එරාවූර් පොලිස් වසමේ ආලයඩි දුම්රිය හරස් මාර්ගයෙන් ධාවනයවූ ත්‍රිරෝද රථයක් මඩකලපුව සිට මහව දක්වා ධාවනයවූ දුම්රියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ රියදුරු එරාවූර් රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වන මීරාකේනි, එරාවූර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය එරාවූර් රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. එරාවූර් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - ඊච්චන්කුලම් පොලිස් වසම.

2023.10.03 වන දින දහවල් කාලයේ ඊච්චන්කුලම් පොලිස් වසමේ ඊච්චන්කුලම් වව්නියාව මාර්ගයේ පුදුකුලම් හන්දියේදී අතුරු මාර්ගයකින් පැමිණි යතුරු පැදියක් ප්‍රධාන මාර්ගයට එක්වරම ඇතුළු කිරීමේදී ඊච්චන්කුලම් දෙස සිට වව්නියාව දෙසට ධාවනය වූ ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදියේ පිටුපස ගමන්කළ දරුවෙකු සහ දැරියක් වව්නියාව රෝහලට ඇතුලත් කිරීමේදී දරුවා මියගොස් ඇත.

**මියගිය ළමයා වයස අවුරුදු 09 ක් වන පුදුකුලම්, වව්නියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වව්නියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු සහ යතුරු පැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. ඊච්චන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 13. රිය අනතුරක් - මස්කෙළිය පොලිස් වසම.

2023.10.03 වන දින රාත්‍රි කාලයේ මස්කෙළිය පොලිස් වසමේ මස්කෙළිය සාමිමලේ මාර්ගයේ 03 කණුව ප්‍රදේශයේදී මස්කෙළිය ප්‍රධාන මාර්ගය දෙසට ධාවනය වූ කැබ් රථයක් රියදුරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන මීටර් 30 ක් පමණ ප්‍රපාතයට පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් කැබ් රථයේ පිටුපස ගමන්කළ කාන්තාවන් 12 දෙනෙකු සහ රියදුරු ඇතුළු පිරිමි පුද්ගලයන් 03 දෙනෙකු තුවාල ලබා දික්ඔය රෝහලට ඇතුලත් කර ඇත.

මස්කෙළිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 14. හදිසි ගින්නක් - තෙරිපැහැ පොලිස් වසම.

2023.10.03 වන දින රාත්‍රී කාලයේ තෙරිපැහැ පොලිස් වසමේ නිල්දණ්ඩාහින්න ප්‍රදේශයේ නිවසක හදිසි ගින්නක් හටගෙන ඇති බවට තොරිපැහැ පොලිසියට ලද පණිවිඩයක් මත වහාම ක්‍රියාත්මක වූ පොලිසිය සහ ප්‍රදේශවාසීන් එක්ව ගින්න මැඩ පවත්වා ඇත.

ගින්න හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. ගින්නෙන් කිසිවෙකුට තුවාල සිදුව නොමැති අතර නිවසට දැඩි අලාභ හානි සිදුව ඇත. තෙරිපැහැ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**